(81)


දුරකථන ) 0112669192, 0112675011
தொலைபேசி ) 0112698507, 0112694033
Telephone ) 0112675449, 0112675280

ෆැක්ස් ) 011-2693866
பெக்ஸ் ) 011-2693869
Fax ) 011-2692913

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )


සුවසිරිපාය
சுவசிறிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) CB/I/ස්.මා.මණ්ඩලය/පොළොන්නරුව/2022
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல
Your No. )

දිනය ) 2022.08.4
திகதி )
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

---

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්/ අධ්‍යක්ෂ/ වෛද්‍ය අධිකාරි,

සියළුම රෝහල්/ ආයතනයන්හි දැන ගැනීම පිණිසයි.

**<u>පොළොන්නරුව මහ රෝහල/ වෘක්කවේද රෝහල සඳහා ස්ථාන මාරු මණ්ඩලයක් පැවැත්වීමට ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම.</u>**

01. පොළොන්නරුව මහ රෝහල/වෘක්කවේද රෝහලේ පැවති පුරප්පාඩු සඳහා සෞඛ්‍ය කාර්ය සහායකයින් අනුයුක්ත කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පවත්වන ලද ස්ථාන මාරු මණ්ඩලයකින් සකස් කල ප්‍රමුඛතා ලේඛනය අනුව සිදු කරන ලදී.

02. එම ස්ථාන මාරු මණ්ඩලය 2020 වසරේ පවත්වා ඇති අතර එම ස්ථාන මාරු ලේඛනයේ සිටින සමහර නිලධාරීන් මේ වන විට විශ්‍රාම ගොස් හෝ වෙනත් තනතුරු සඳහා උසස්වීම් ලබා ඇත. එසේම 2020 වසර වනවිට සෞඛ්‍ය කාර්ය සහායක සේවක මහත්ම මහත්මීන් ස්ථාන මාරු ඉල්ලීමට හේතු වූ කරුණු මේ වන විට වෙනස් වී ඇති බැවින් එම ප්‍රමුඛතා ලේඛනය අවලංගු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

03. ඒ අනුව නව ස්ථාන මාරු මණ්ඩලයක් පැවැත්වීමට කටයුතු කරන අතර පොළොන්නරුව මහ රෝහල/වෘක්කවේද රෝහල වෙත ස්ථාන මාරු අපේක්ෂා කරන සියළු සෞඛ්‍ය කාර්ය සහායක සේවක මහත්ම මහත්මීන් අයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද ස්ථාන මාරු අයදුම්පත් 2022.08.31 දිනට පෙර අධ්‍යක්ෂ(පාලන)04 අංශය වෙත එවීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි. එසේම ස්ථාන මාරු ලබා දීමේ ප්‍රමුඛතාවය තීරණය කිරීම සඳහා අවශය සියළු ලේඛනවල පිටපත් ඒ සමඟ එවීමට කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වා සිටිමි.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

---

05. මෙම පත්වීම ස්ථිරය. එසේ වුවත් ඔබ එක් වර්ෂයක වැඩ බැලීමේ කාලයකට යටත් විය යුතු වේ. මෙම පත්වීම් ලිපියෙන් බැඳුණු යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කරමින් ද, යහපත් හැසිරීම තුළින් ද, කාර්යක්ෂම ලෙස සේවය කිරීම තුළින් ද, ඔබ රාජ්‍ය සේවය සඳහා සුදුස්සෙකු බව එම කාලය තුළදී සනාථ කළ යුතු වේ. එසේම වැඩ බැලීමේ කාලය තුළදී ඔබ විසින් සම්පූර්ණ කළ යුතු මෙම පත්වීම් ලිපියෙහි අනෙකුත් අවශ්‍යතා සපුරාලීමට ද ඔබ වගබලා ගත යුතුය. මෙම සියලු අවශ්‍යතා යථා පරිදි සපුරාලීමට ඔබ සමත් වුවහොත් පමණක් වැඩ බැලීමේ කාලය අවසානයේ මෙම පත්වීම ස්ථිර කරනු ලැබේ. එසේ කිරීමට ඔබ අපොහොසත් වන බව පෙනී යන්නේ නම් එම කාලය තුළදී හෝ එම කාලය අවසානයේදී හෝ මෙම පත්වීම අවසන් කිරීමට හෝ ඔබ කලින් දැරූ තනතුරට ආපසු යැවීමට හැකිය. ඔබගේ පත්වීම ස්ථිර තත්ත්වයට පත් වනුයේ, එම පත්වීම ස්ථිර කළ බවට පත්කිරීම් බලධරයා විසින් විධිමත් ලිපියක් නිකුත් කිරීමෙන් පසුව පමණක් වේ. එතෙක් ඔබගේ පත්වීම ස්ථිර කර නොමැති සේ සැලකේ.

06. මෙම පත්වීම සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය) තනතුර සඳහා වන 2012.07.20 දිනැති බඳවා ගැනීම් පටිපාටියෙහි දක්වා ඇති සියලු කොන්දේසි හා විධිවිධාන වලටද එයට කලින් කළ එක් කරනු ලබන හෝ එයින් ඉවත් කරනු ලබන සියලු කොන්දේසි හා විධිවිධාන වලටද පූර්ණ වශයෙන් යටත් වේ.

07. මෙම පත්වීමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි දැක්වෙන PL-01-2006 වැටුප් කේත අංකයට අදාළ 24250-10 X 250 - 10 X 270 - 10 X 300 - 12 X 330 – 36410 /- (මාසික) වැටුප් පරිමාණය හිමි වන අතර රජයේ නිලධරයන් වෙත කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද ඔබට හිමිවේ. එසේම මෙම තනතුරට පත් කිරීම හේතුවෙන් දැනට ඔබ ලබන වැටුපේ හෝ වැටුප් වර්ධක දිනයේ වෙනසක් සිදු නොවේ. තනතුරු නාමය පමණක් වෙනස් වේ.

08. මෙම පත්වීම භාර ගැනීමට පෙර ඔබ විසින් ඔබගේ අනන්‍යතාව යථා පරිදි තහවුරු කළ යුතු වේ.

09. පත්වීම භාරගත් විගස තමන් රාජකාරි සඳහා වාර්තා කළ බව සනාථ කෙරෙන ලිපියක් කාර්ය පටිපාටික රීති පරිශිෂ්ඨ අංක 4 ආකෘති පත්‍රය ප්‍රකාරව ඔබ විසින් ලබා දිය යුතුය.

10. මෙම ලිපිය ලැබුනු බවත්, මෙහි දැක්වෙන කොන්දේසි වලට යටත්ව මෙම පත්වීම ඔබ විසින් භාර ගන්නේද යන බවත්, කාර්ය පටිපාටික රීති පරිශිෂ්ඨ අංක 3 ආකෘති පත්‍රය සම්පූර්ණ කර සෞඛ්‍ය ලේකම් වෙත විගස දන්වා එවිය යුතු වන්නේය.

11. තවද, ඔබ දැනට දරන තනතුරට අදාළ පත්වීම් ලිපියේ සඳහන් අදාළ අනෙකුත් කොන්දේසි සියල්ල තවදුරටත් නොවෙනස්ව එලෙසින්ම බලපවත්වනු ලබන බවද දන්වමි.

අ/කලේ - වෛද්‍ය එස්.එච්.මුණසිංහ
ලේකම්

සිරිමල් ලොකුගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)I

පිටපත් - 01. විගණකාධිපති
02. ආයතන ප්‍රධානි
03. කාර්යාලයීය පිටපත